# කෝ හඳ මාමා?



ජානකී සූරියආරච්චි



# කෝ හඳ මාමා?

කතාව චිත්‍ර

පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

ජානකී සූරියආරච්චි

ටිකිරි ප්‍රකාශකයෝ

1490/8, හෝකන්දර පාර, පන්නිපිටිය.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

ප්‍රථම මුද්‍රණය -2007

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-46-3
**Book Ref: T/07/133**

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තුතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, "හරිම කරදරේ" කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
01-11-2007

# කෝ හඳමාමා?



හඳ මාමා හරි ආසයි වටකුරුවට බැබලෙන්න.
එයා හැමදාම රෑට අහසට ඇවිත් මුහුදට එබිලා
මූණෙ හැඩ බලනවා.

එදා අමාවක දවසක්. හැම තැනම කළුවරයි.
හඳ මාමා අහසට ඇවිත් මුහුදට එබුණා, මූණ බලන්න.
කෝ ? මොනවත් පෙනෙන්නෙ නෑ. හඳ මාමාට හරි දුකයි.
වටකුරුවට මූණ පෙනෙන්නෙ පෝය දාට විතරයිනෙ.
ඊට පස්සෙ ටික ටික මූණ නොපෙනී යනවා. ඇයි මේ?



"මිහ්, මිහ්" හඳ මාමා අඬන්න පටන් ගත්තා.
කඳුළු බිංදු මුහුදටත් වැටුණා.
එතකොටම සුළං රළක් එතනට ආවා.
"ඇයි හඳ මාමා අඬන්නෙ?" සුළං රළ ඇහුවා.
"අද මගේ මූණ පෙනෙන්නෙ නෑ." හඳ මාමා අඬ අඬා කීවා.
"අනේ, මම නම් දන්නෙ නෑ හඳ මාමෙ, ඒ ඇයි කියලා."
සුළං රළ කීවා.

ඊළඟට පොද වැස්සක් වහින්න පටන් ගත්තා.
හඳ මාමා වැස්සෙ තෙමි තෙමී ඇඬුවා.
"ඇයි හඳ මාමා අඬන්නෙ?" වැස්ස ඇහුවා.
"අද මගේ මූණ පෙනෙන්නෙ නෑ." හඳ මාමා කීවා.
"ඇත්ත තමයි, ඒත් අනේ මම නම් දන්නෙ නෑ, ඒ ඇයි කියලා."
වැස්ස කීවා.





ඊළඟට වලාකුලක් පාවෙලා ආවා.
"ඇයි හඳ මාමා අඬන්නෙ මේ?" වලාකුල ඇහුවා.
"අනේ මම ආසයි හැමදාම වටකුරුවට බබලන්න. ඒත් මගේ මූණ එක එක දවසට පෙනෙන්නෙ එක එක තරමටයි. අද මාව පෙනෙන්නෙම නෑ. " හඳ මාමා කීවා.
"ඇත්ත තමයි, ඒත් අනේ මම දන්නෙ නෑ, ඒ ඇයි කියලා. ඉර මාමා නම් දන්නවා ඇති. අපි ඉර මාමාගෙන් අහල බලමු." වලාකුල කීවා.



වලාකුල ගියා ඉර මාමා හම්බවෙන්න. ඉර මාමා හරි රස්නෙයි.
ගිනි බෝලයක් වගේ පිච්චෙනවා, බලන්නත් අමාරුයි.
වලාකුල ඈත ඉඳන් ඉර මාමාට කතා කළා.
"ඉර මාමේ, හඳමාමා අඬනවා අද එයාගෙ මූණ පෙනෙන්නෙ නෑ
කියලා. අනේ ඒ ඇයි කියලා කියන්නකෝ."



ඉර මාමා හිනා වුණා. "ඉතින් අද අමාවක නෙ. අමාවකට හඳ පෙනෙන්නෙ නැහැනෙ." ඉර මාමා කීවා.
"ඇයි ඒ?" වලාකුල ඇහුවා.
"ඒක දිග කතන්දරයක්. පුංචි වලාකුලට තේරේවිද දන්නෙ නෑ." ඉර මාමා කීවා.
"අනේ ඉර මාමේ, කියා දෙන්නකෝ. මම හරි ආසයි දැනගන්න." වලාකුල ආසාවෙන් කීවා.



“හොඳයි! වලාකුල දන්නවාද, මේ මමයි, හඳමාමායි, පුංචි බබාලා ඉන්න මහ පොළොවයි, බෝල වගේ රවුම් කියලා?”
වලාකුළ ඔළුව වැනුවා.
“මමයි, හඳමාමායි, මහ පොළොවයි, අහසෙ ඉන්නෙ මෙන්න මේ වගේ.” ඉර මාමා ලොකු විස්තරයක් කියන්න පටන් ගත්තා හඳ මාමා කන් දීගෙන අහගෙන හිටියා.



"ඉතින් ඉර මාමෙ කියන්නකෝ,
ඇයි අද හඳ මාමා එළිය දෙන්නෙ නැත්තෙ?"
වලාකුලට ඉවසිල්ලක් නෑ.

"පුංචි වලාකුලේ, හඳ මාමා ඇත්තටම එළිය දෙන්නෙ නෑ.
හඳ මාමා කහ පාටින් බැබලෙන්නෙ මගේ එළිය
මූණට වැටුණාමයි, මෙන්න මේ වගේ.
ඒත් අද ඒ එළිය වැටුණු පැත්ත පොළොවට පෙනෙන්නෙ නෑ,
පොළොවට හැරිලා තියෙන්නෙ කළුවර පැත්තනෙ. එතකොට
පුංචි බබාලා අහස බැලුවාට හඳමාමා පෙනෙන්නෙ නෑ.
හඳ මාමා මුහුදට එබුණාට මූණ පෙනෙන්නෙත් නෑ."



"---ඒත් ටික දවසකින් ආයෙත් පෙනෙන්න
පටන් ගන්නවා." ඉර මාමා කීවා
"ඒ කොහොමද ඉර මාමෙ?" වලාකුල ඇහුවා.

"පුංචි වලාකුල දන්නවාද, හඳමාමා හැමදාම එක තැන ඉන්නෙ
නැහැ කියලා. හඳමාමා දවසින් දවස හෙමින් හෙමින් පොළොව
වටේ කැරකෙනවා. පොළොව වටේ රවුමක් කැරකෙන්න දවස්
විසි අටක් ගතවෙනවා. එහෙම යනකොට හඳමාමාගෙ මූණ
පොළොවට පෙනෙන හැටි වෙනස් වෙනවා. හඳමාමාගෙ මූණ
වටකුරුවට හොඳට පෙනෙන්නෙ පසළොස්වක පෝය දවසටයි"
ඉර මාමා කියාගෙන කියාගෙන ගියා.
වළාකුල කල්පනාවෙන් අහගෙන හිටියා.




"ඉතින් ඉර මාමෙ, පසලොස්වක පෝය දාට කොහොමද ඒ තරම් හොඳට හඳමාමා පෙනෙන්නෙ?" වලාකුල ඇහුවා.

"පසලොස්වක පෝය දාට හඳමාමා ඉන්නෙ පොළොවෙන් එහා පැත්තෙනෙ. එතකොට හඳමාමාගෙ මූණ, හොඳට පොළොවට පෙනෙනවා. ඊත් ඊට පස්සෙ පෝය පහුවෙලා, දවස් දහ හතරක් යනකොට, හඳ මාමා එනවා පොළොවයි මායි අතරට. එතකොට හඳමාමගෙ මූණ පොළොවට පෙනෙන්නෙ නෑ. එදාට තමයි අද වගේ අමාවක කියන්නෙ. " ඉරමාමා කීවා

"එතකොට ඊට පස්සෙ----?"
වළාකුලට ඉවසිල්ලක් නෑ විස්තරේ දැනගන්න කල්.




“ඊට පස්සෙ, ඉතිරි දවස් දහ හතරෙදි හඳ මාමා කැරකිලා අනික් පැත්තෙන් පොළොව වටේ ගියාම ආයෙත් වටකුරුවට පෙනෙනවා. එදාට ආයෙත් පසලොස්වක පෝය ලබනවා.” ඉර මාමා කීවා.

”එතකොට සමහර දවසට හඳ මාමා පුංචි පළුවක් වගේ පෙනෙන්නෙ ඇයි? ඒ දවසට ඉර මාමාගෙ එළිය හඳමාමාට ලැබෙන්නෙ අඩුවෙන්ද?” වලාකුල ඇහුවා.




" නෑ, නෑ, හඳමාමාට මගේ එළිය වැටෙන්නෙ හැමදාම එක වගේ. ඒත් එක වගේ පෙනෙන්නෙ නෑ." ඉර මාමා කීවා.
"හැමදාම එක වගේ ඉර එළිය වැටෙනවා නම් ඇයි හැමදාම එක වගේ පෙනෙන්නෙ නැත්තෙ? අනේ මට තේරෙන්නෙ නෑ ඉර මාමෙ." වලාකුල දුකෙන් කීවා.

"පුංචි වලාකුලේ, හඳමාමා දවස් විසි අටකට වරක් පොළොව වටේ කැරකෙනවානෙ. එතකොට හඳ මාමාගෙ මූණට එක වගේ එළිය වැටුණාට එක එක දවසෙදි පොළොවට පෙනෙන හැටි වෙනස් වෙනවා එතකොට පොළොවෙ ඉන්න පුංචි බබාලාට, හඳේ ඉර එළිය වැටුණු කොටස පෙනෙන්නෙ එක එක තරමටයි. දැන් පුංචි වලාකුලට තේරුණාද?" ඉර මාමා ඇහුවා.




"ඔව් ඉර මාමෙ, දැන් මට තේරුණා. ඒ කියන්නෙ පසළොස්වක පෝය දාට පොළොවෙන් එහා පැත්තෙ ඉන්න නිසා හඳමාමාගෙ මූණ වටකුරුවට පෙනෙනවා. ඊට පස්සෙ ටික ටික කැරකෙනකොට මූණ නොපෙනී ගිහින් අමාවක ලබනවා. ආයෙත් අනික් පැත්තෙන් කැරකිලා පොළොවෙන් එහා පැත්තට එනකොට ආයෙත් පසළොස්වක ලබනවා." වළාකුල කීවා.

"හරියට හරි !" ඉර මාමා කීවා.

"ඒ කියන්නෙ හැම පසළොස්වක පෝය දාටම වටකුරුවට මූණ බලන්න පුළුවන් නේද?" හඳමාමා ඉවසිල්ලක් නැතුව ඇහුවා.
"ඔව් ඔව් ඔව්" ඉර මාමා කීවා



දැන් නම් හඳ මාමාට සන්තෝසයි. ඇයි? හැම දවස් විසි අටකටම පස්සෙ, නොවරදවාම වටකුරුවට මූණ පෙනෙන බව දන්නවානෙ. හඳ මාමා සන්තෝසෙන් හිනා වුණා. වළාකුලටත් සන්තෝසයි. දෙන්නාම ඉර මාමාට ස්තුති කළා.

ඉතින් ඊට පස්සෙ හඳ මාමා හැමදාම නොඉවසිල්ලෙන් එබි එබී බලා ඉන්නවා, පෝය දවස එනකල්, ඉර මාමාගෙ එළියෙන් වටකුරුවට හිනා වෙවී බැබලෙන්න !